# රළ

විප්ලවයේ නිදහස උදෙසා කලාව!
කලාවේ පරිපූර්ණ නිදහස උදෙසා විප්ලවය!

කලා - සංස්කෘතික අතිරේකය
2023 ජනවාරි

කලාව හා දේශපාලනය පිළිබඳ විවිධ දෘෂ්ටිකෝණයන්ගෙන් විවරණය කෙරෙනු දක්නට ලැබේ. කලාව යනු කුමක්දැයි වටහා ගැනීමේ සිට එහි දේශපාලන කියැවීම් උදෙසා වන ප්‍රයත්නයන් ඉතිහාසය පුරා සිදු කරනු ලැබ ඇත. වමේ දේශපාලන ව්‍යාපාර විසින්ද කලාවේ ප්‍රභවය, පැවැත්ම හා විචාරය සම්බන්ධ සිදුකරන ලද විශ්ලේෂණ මෙන්ම කලාව අරුත් ගැන්වීම වනුවෙන් සහ එහි ප්‍රගතිය වෙනුවෙන් කළ සම්ප්‍රදානයන් බොහෝය.

මෙවර අප 'රළ' කලාපයේ පළ කෙරෙන පහත ලේඛනය, ස්වාධීන විප්ලවවාදී කලාවක් අරමුණු කරගෙන දියාගෝ රිවේරා සහ අන්ද්‍රෙ බ්‍රෙටන් විසින් අත්සන් කර පළ කරන ලද ඓතිහාසික ලේඛනයකි. මෙම ලේඛනය ප්‍රකාශයට පත් කිරීමෙන් පසුව එම ප්‍රතිපත්තිමය එකඟතා ක්‍රියාත්මක කිම පිණිස 1938 දී පිහිටුවන ලද සංවිධානය 'ස්වාධීන විප්ලවවාදී කලාව පිළිබඳ ජාත්‍යන්තර සම්මේලනය' (FIARI) ලෙස හැඳින්වේ. පවතින ධනපති සමාජයේ කලාව පිළිබඳ ආස්ථානයන් ප්‍රතික්ෂේප කරමින් ස්වකීය විප්ලවවාදී දේශපාලන හා සංස්කෘතික ස්ථාවරයන් මත පදනම්ව කෙටුම්පත් කළ මෙම ප්‍රකාශනය අන්ද්‍රෙ බ්‍රෙටන් සහ දියාගෝ රිවේරා විසින් නිල වශයෙන් අත්සන් කළා වුවද එය ලියොන් ට්‍රොට්ස්කි විසින් අන්ද්‍රෙ සමග බවට සැලකේ.

1938 අප්‍රේල් මාසයේදී අන්ද්‍රෙ බ්‍රෙටන් ප්‍රංශ විදේශ කටයුතු අමාත්‍යාංශයේ අවශ්‍යතාවක් මත මෙක්සිකෝවට ගිය අවස්ථාවේදී, ඔහු ලියොන් ට්‍රොට්ස්කි දැන හඳුනාගෙන විප්ලවවාදී කලා භාවිතයක් වෙනුවෙන් සිය මූලික අදහස් ලේඛනගත කළහ. එකී අදහස් සහිත ප්‍රකාශනය තුළින් 'ස්වාධීන විප්ලවවාදී කලාව පිළිබඳ ජාත්‍යන්තර සම්මේලනයක් පිහිටුවීම ඉල්ලා සිටිකු ලැබීය. බ්‍රෙටන් නැවත ප්‍රංශයට පැමිණි පසු, ඔහු එකී අවශ්‍යතාව සපුරනු පිණිස 'ස්වාධීන විප්ලවවාදී කලාව පිළිබඳ ජාත්‍යන්තර සම්මේලනය' පිහිටුවමින් පැරිස්, ලන්ඩන් සහ නිව්යෝර්ක් මෙන්ම මෙක්සිකෝවේ ශාඛා පිහිටුවීය. මෙම සංවිධානයට බෙන්ජමින් පෙරට්, යවෙස් ටැංගයි, අන්ද්‍රෙ මැසන්, වික්ටර් සර්ජ්, මර්සල් මාටිනට්, ඉග්නාසියෝ සිලොනෙ ආදී සමකාලීන කලාකරුවන්ගේ අනුග්‍රහය හිමි විය. පසුව, ඉංග්‍රීසි සාහිත්‍යකරු ජෝර්ජ් ඕවල්ගේ සහය ද දිනාගනු ලැබිණි. කෙසේ වෙතත්, යුරෝපය පුරා ගැඹුරුවන දේශපාලන අර්බුදයක් මධ්‍යයේ ඇති වූ ප්‍රායෝගික අවහිරතා හේතුවෙන් මෙම 1939 පමණ සම්මේලනයේ ක්‍රියාකාරිත්වය අහෝසි විය.

වසර 85ක් පැරණි වුවද මේ ලේඛනය විප්ලවවාදී කලා ස්ථාවරයන් නිරවුල්ව ප්‍රකාශයට පත් කරන්නක් ලෙස අපගේ අවධානයට ලක් වේ.

# ස්වාධීන විප්ලවවාදී කලාවක් සඳහා වූ ප්‍රකාශනය

අතිශයෝක්තියකින් තොරව අපට කිව හැක්කේ ශිෂ්ටාචාරය අද තරම් අන් කිසිදාක මේ තරම් බරපතල ලෙස තර්ජනයට ලක්වී නැති බවය. ම්ලේච්ඡ හා සාපේක්ෂව අකාර්යක්ෂම උපකරණ රැගත් 'වැන්ඩල්වරු' යුරෝපයේ එක් කෙළවරක පෞරාණික සංස්කෘතිය මකා දැමූහ. නමුත් අද අපි දකින්නේ ලෝක ශිෂ්ටාචාරය, නවීන තාක්ෂණයේ සමස්ත අවි ගබඩාවකින්ම සන්නද්ධ ප්‍රතිගාමී බලවේගවල පහරවල්වලට හසුව පසුබාමින් වුවද ස්වකීය ඓතිහාසික ඉරණමට මුහුණ දෙමින් සිටින ආකාරයයි. අප මෙයින් අදහස් කරන්නේ, ළං වන ලෝක යුද්ධය ගැන පමණක් නොවේ. 'සාමය' සහිත කාලවලදී පවා කලාවේ සහ විද්‍යාවේ පැවැත්ම පවතින්නේ කිසිලෙසකින්වත් ඉවසා දැරිය හැකි තත්ත්වයක නොවේ.


පුද්ගල මට්ටමෙන් ආරම්භ වන තාක් දුරට, සංස්කෘතියේ වෛෂයික සාරවත් බවක් ඇති කරන යමක් නිර්මාණය කිරීමට ආත්මීය කුසලතා ක්‍රියාත්මක වන තාක් දුරට, ඕනෑම දාර්ශනික, සමාජ විද්‍යාත්මක, විද්‍යාත්මක හෝ කලාත්මක නිමැවුමක්, අනර්ඝ එහෙත් අහම්බයක් ලෙස පෙනේ. එනම්, එවැනි නිර්මාණයක් පෙනෙනුයේ අඩු වැඩි වශයෙන් ස්වයංසිද්ධව මතුවන අවශ්‍යතාවේ පලයක් ලෙසය. සාමාන්‍ය දැනුමේ (පවතින ලෝකය අර්ථකථනය කරන) හෝ විප්ලවීය දැනුමේ (ලෝකය වඩා යහපත් අතට වෙනස් කිරීමට නම්, එහි චලනය පාලනය කරන නියාමයන් පිළිබඳ නිවැරදි විශ්ලේෂණයක් ඉල්ලා සිටින) හෝ ආස්ථානයෙන් එවැනි නිර්මාණ සුළු කොට තැකිය නොහැක. නිශ්චිතවම, නිර්මාණාත්මක ක්‍රියාකාරකම් සිදු වන බුද්ධිමය තත්වයන් ගැන අපට නොසැලකිලිමත් විය නොහැක. එසේම, එකී බුද්ධිමය නිර්මාණකරණය හසුරුවන්නා වූ විශේෂිත නියාමයන්ට ගරු කිරීමට අප අසමත් නොවිය යුතුය.

සමකාලීන ලෝකය තුළ බුද්ධිමය නිර්මානය කළ හැකි එම තත්වයන් විනාශයට පත් කරන ක්‍රියාවලියක් ව්‍යාප්ත වන බව අප හඳුනාගත යුතුය. මෙයින් ඇතිවන අනිවාර්ය ප්‍රතිපලය ලෙස කලා කෘති පමණක් නොව විශේෂයෙන් 'කලාත්මක' පෞරුෂයේ සිදුවන පරිහානිය ද වඩ වඩාත් පැහැදිලිය. හිට්ලර්ගේ පාලන තන්ත්‍රය විසින් දැන් නිදහස සම්බන්ධ යම් හෝ හැඟීමක් දක්වන කලාකරුවන් ජර්මනියෙන් ඉවත් කර ඇත. එහෙත්, මතුපිටින් බැලුවද, තවමත් පෑන හෝ පින්සල අතට ගැනීමට එකඟ වන කලාකරුවන් පාලන බලයේ ගෘහ සේවකයන්ගේ තත්වයට පහත දමා ඇත. ඔවුන්ට සිදුව ඇත්තේ තිබිය හැකි නරකම සෞන්දර්යාත්මක සම්මුතීන්ට අනුව යමින් පාලන බලය උත්කර්ෂයට නැංවීමටයි. වාර්තා විශ්වාස කළ හැකි නම්, මේ වනවිට තර්මිඩෝරියානු(නිලධාරිවාදී) ප්‍රතිගාමිත්වය එහි උච්චතම අවස්ථාවට ළඟා වෙමින් පවතින සෝවියට් සංගමයේ ද තත්වය එසේම වේ.

'ප්‍රජාතන්ත්‍රවාදී' අතීතයේ ඉරිතැලී ගිය නටබුන් මත එල්ලී සිටින, ගතානුගතික හා බියට පත්, පිලිස්තීන්වනුගේ අදහස්වලට ගැළපෙන, 'ෆැසිස්ට්වාදයත් එපා, කොමියුනිස්ට්වාදයත් එපා' යන ආඥාදායක පාලන තන්ත්‍රය, තමන් විසින් පාලනය කරන ඊනියා සංස්කෘතික සංවිධාන හරහා වෙනත් රටවල කටයුතු කරමින්, සෑම ආකාරයකම අධ්‍යාත්මික වටිනාකම් වලට සතුරු සන්ධ්‍යා අඳුරක් මුළු ලෝකය පුරාම ව්‍යාප්ත කර ඇත. බුද්ධිමතුන් හා කලාකරුවන් ලෙස වෙස්වලාගෙන සිටින මිනිස්සු, මේ නින්දිත ලේ වැකි සන්ධ්‍යාව තුළ, වහල් සේවය වෘත්තියක් කරගත්, වැටුපට බේගල් කීම සිරිතක් කරගත්, අපරාධ වසන් කිරීමෙන් සතුටු වෙති. ඉතිහාසයේ කිසිදු නිදසුනක් නැති තරම් නිර්ලජ්ජිතභාවයකින් යුතු


ලියොන් ට්‍රොට්ස්කි


දියාගෝ රිවෙයිරා


අන්ද්‍රෙ බ්‍රිටන්

ස්ටැලින්වාදයේ නිල කලාව, තම කුලී සේවාවට යහපත් මුහුණුවරක් ඇති කිරීමට ඔවුන් දරන උත්සාහය පිළිබිඹු කරයි.

කලාවේ මූලධර්ම සම්බන්ධයෙන් මේ ලැජ්ජා සහගත නිෂේධනය, කලාත්මක ලෝකය තුළ පිළිකුලක් ඇති කරන වහල් රාජ්‍යයන් පවා ගෙන යාමට එඩිතර නොවූ තත්වයකි. මේ පිළිබඳ ක්‍රියාකාරී, සම්මුති විරහිත විරෝධයක් ගොඩනැගිය යුතුය. උදාරත්වය පිළිබඳ සියලු හැඟීම් මෙන්ම සහ මානව ගරුත්වය පවා විනාශ කරන පාලන තන්ත්‍රයන් අපකීර්තියට ගර්භාවට පත්කර පෙරළා දැමීමේදී සහ යහපත් ලෝකයක් වෙනුවෙන් නිර්ධන පංතියට ඇති අපේක්ෂාවන්ටද, ප්‍රයෝජනවත් ලෙස දායක විය හැකි එක් බලවේග යක් වන්නේ සහ ලේඛකයන්ගේ සහ කලාකරුවන්ගේ මෙම විරෝධයයි.

කොමියුනිස්ට් විප්ලවය කලාව කෙරෙහි භීතියක් දරන්නේ නැත. පිරිහුණු ධනේශ්වර සමාජයක කලාකරුවාගේ භූමිකාව තීරණය වන්නේ පුද්ගලයා සහ පුද්ගලයාට සතුරු විවිධ සමාජ ස්වරූපයන් අතර ගැටුම මත බව එය වටහා ගනී. මෙම කාරණා මත පමණක්ම, මේ තත්වය පිළිබඳ සවිඥානික වන තාක් දුරට, කලාකරුවා විප්ලවයේ ස්වභාවික කොටස්රුවකු බවට පත් කරයි. මනෝවිශ්ලේෂණයෙන් විස්තර කෙරෙන ආකාරයට අභ්‍යන්තර වශයෙන් 'ego' සහ එය ප්‍රතික්ෂේප කරන බාහිර තත්වය අතර බිඳී ගිය සමතුලිතතාවය යථා තත්වයට පත් කිරීමට 'උත්කර්ෂණය' (sublimation) විසින් උත්සාහ කරයි. සියලුම පුද්ගලයන්ට පොදු කරුණක් ලෙස, දරාගත නොහැකි, පවතින යථාර්ථයට එරෙහිව, අභ්‍යන්තරික ලෙස පුබුදුවන සහ වර්ධනය කරවන 'id' හි සියලු ශක්තීන් මෙහෙයවමින් මෙම ප්‍රතිෂ්ඨාපන ක්‍රියාවලිය සිදුන්නේ, 'ස්වීය පරමාදර්ශය' උදෙසාය. පුද්ගල ආත්මයට දැනෙන මෙකී විමුක්ති අවශ්‍යතාව, සපුරාලිය හැක්කේ එහි ස්වභාවික ගමන්මග ඔස්සේ යමින් අතිමූලික අවශ්‍යතාවක් වන මිනිස් වර්ගයාගේ විමුක්තිය නමැති ප්‍රවාහය හා සම්මිශ්‍රණය කිරීමෙන් පමණි.

මෙහිදී මාක්ස් විසින් තරුණ කාලයේ සකස් කරන ලද ලේඛකයාගේ කාර්යභාරය පිළිබඳ සංකල්පය මතකයට ගනිමු. ඔහු කීවේ මෙවැන්නකි.

"ජීවත්වීම සහ ලිවීම සඳහා ලේඛකයා මුදල් ඉපයිය යුතු නමුත්, ඔහු කිසිදු තත්වයක් යටතේ ජීවත් වීම හා මුදල් ඉපැයීම සඳහා ලිවීම නොකළ යුතුය... ලේඛකයා කිසිසේත්ම ඔහුගේ කෘති දෙස බලන්නේ යැපීමේ මාධ්‍යයක් ලෙස නොවේ. කෘතියප පරමාර්ථ වශයෙන් එම කෘතිය ලෙසම පවතී. ඔහුගේත් අන්‍යයන්ගේත් ඇසින් කෘතිය පැවැත්මක් ලෙස අදාළ වන්නේ ඉතා අල්ප වශයෙනි. මාධ්‍ය නිදහසේ පළමු කොන්දේසිය වන්නේ එය ව්‍යාපාරික ක්‍රියාවලියක් නොවීමයි. '

රාජ්‍ය විසින් මවන ව්‍යාජ හේතුන්වලට මුවා වී බුද්ධිමය ක්‍රියාකාරකම් ඊටම නොගැළපෙන දිසාවන්ට මෙහෙයවන, කලාවට තේමාවන් නියම කරන අයට එරෙහිව මෙම ප්‍රකාශය යොදා ගැනීම, අන් කවරදාටත් වඩා වරතමානයේදී සුදුසු ය. නිර්මාණකරණයේදී තේමාවන් නිදහසේ තේරීම සහ ඔහුගේ ක්‍රියාකාරී පරාසයේ සියලු සීමාවන් නොමැති වීම කලාකරුවාට හිමි බිසිවකුට පැහැර ගත නොහැකි අයිතියක් ඇති වේ. කලාත්මක නිර්මාණ ක්ෂේත්‍රය තුළ, පරිකල්පනය සියලු බාධාවන්ගෙන් නිදහස් කළ යුතු අතර කිසිදු කඩතුරාවක් යටතේ එය බැඳීම්වලට යටත් කිරීමට ඉඩ නොදිය යුතුය. අද දවසේ හෝ හෙට වෙනුවෙන් කලාව එහි ස්වභාවයට කිසිසේත්ම නොගැලපෙන විනයකට යටත් විය යුතු බවට බල කරන අය, අපි තරයේ ප්‍රතික්ෂේප කරමු. 'කලාව සඳහා පූර්ණ නිදහස' වෙනුවෙන් අපි

2 පිටුවට..